# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්

## ඉරිදා

පෙ.ව. 8.15 - 9. 15 - ඉරිදා පාසැල
අවුරුදු 3 - 18 දක්වා ළමුන් සඳහා

පෙ.ව. 9.30 - 12. 00 - රොටී කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

ප.ව. 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම
(සිංහල)

ප.ව. 6.00 - 7.30 - සුභාරංචි රැස්වීම
(ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව. 6.30 - 7. 30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව. 6.00 - 7. 30 - යාච්ඤා රැස්වීම
අසනීප සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම.

## සිකුරාදා

ප.ව. 6.00 - 7. 30 - බයිබල් අධ්‍යයනය


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය,
අංක. 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන : 0112 581 901
www.christianfellowshipcentre.com



මුද්‍රණය : ප්‍රසාද් ග්‍රැෆික් ඇන්ඩ් ප්‍රින්ටින්
වටමාවත, හල්පිට, පොල්ගස්ඕවිට. දුර : 071 2228903/ 071 2228906



# ලෝකාලෝකය

2015 සැප්තැම්බර් - නොවැම්බර් කලාපය

දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන මනුෂ්‍යයා.....,
ජලය ළඟ හිටවා තිබෙන්නා වූ, ගඟ ළඟ මුල් අදින්නා වූ,
ග්‍රීෂ්මය පැමිණෙන විට එය නොදැනෙන්නා වූ ......,
ඵල දැරීමෙන් තොර නොවෙන්නා වූ,
ගහකට සමාන වන්නේ ය.
(යෙරමියා 17:7:8)


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය,
විවේකානන්ද පාර, කොළඹ 06.

ලෝකාලෝකය




ප්‍රහේලිකාව

**හරහට**

1. මොහු විශ්වාස සාක්ෂිකාරයෙක් බව එළිදරව් 2 සඳහන් වේ.
5. හදවත
6. නමකි.
7. දෙවියන්වහන්සේ යහපතක් බව දැන ගන්න.
8. උන්වහන්සේ දිළිඳා මෙම ගොඩින් ඔසවන සේක.
9. ඌශ් දේශයේ සිටිය මනුෂ්‍යයෙකි.
10. අලුත්
11. පර්වතයෙන් වතුර දුන් ස්ථානයට මේ නම තැබිණි.
13. මුල් යුවල ජීවත්වුනේ මේ උයනේ ය.
14. ස්වාමීන්වහන්සේ මොහු කරණ කොට ගෙන සිරියවරුන්ට ජය දී තිබුණේය.

**පහළට**

1. නෝවාගේ නැව නැවතුනේ මේ කඳු මතය.
2. යේසුස්වහන්සේ පාවා දීමේ දී යුදස්ට ලැබුණු රිදී කාසි ගණනයි.
3. බයිබලයේ ආරම්භයේ සිට අවසානය දක්වා මේවා ඇත.
4. උන්වහන්සේගේ අතේ මෙය තිබෙන බව මතෙව් 3 සඳහන් වේ.
6. මාර්තාගේ සොහොයුරායි.
9. හිස්වූ සොහොන ළඟට මේ ස්ත්‍රියද ගිය බව ලූක් පොතේ සඳහන් වේ.
10. නාදය
11. මොවුන් මහත් රාශියක් නිසා පේත්‍රුස්ගේ දැල ඉරෙන්ට පටන් ගත්තේය.
12. පාවුල් මිලේතසට යන ගමනේදී මේ ස්ථානයටද ලඟාවූ බව සඳහන් වේ.
13. හොප්නි හා පිනේහාස් ගේ පියා ය.

- උපාලි නන්දන -

# "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතුව සිටපල්ලා"(මතෙව් 21 : 22)

ප්‍රිය සහෝදර සහෝදරිය,

ස්වාමීවූ යේසුස්වහන්සේගේ අපූර්ව නාමයෙන් ඔබට ආචාර කරමි. නැවත පැමිණීමට සූදානම්ව සිටින යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබත් ඔබගේ ඇදහිල්ලත් ආරක්ෂා කරන සේක්වා. සියළු සැක හා අධෛර්‍යමත් වීම් සුව කර ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ ප්‍රීතියෙන් පුරවන සේක්වා. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගේ කුරුසියේ මරණය කරණකොට ගෙන ලොව එළිදරව් වූ පියාණන්වහන්සේගේ ප්‍රේමය කරණ කොටගෙන ඔබගේ සියළු පාපවසා, සියළු භයින් දුරුකරන සේක්වා.

ලෝකාලෝක සඟරාව ආත්මික කිතුණු සඟරා අතර පැරණි තම සඟරාවක් ලෙස දැන් අවුරුද් 50 අධික කාලයක් ශ්‍රී ලාංකික කිතුණුවන් අතර හා අන්අය අතර සැරිසරා සහාව පෝෂණය කිරීම පිළිබඳ සියල්ලට අධිපති වූ ප්‍රිය දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා වේවා.!

වර්තමානයේ දී ද මෙම කුඩා පොත ඔබගේ ජීවිතය හා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සහාව පෝෂණය කර වර්ධනය කළ යුතුයි යන්න අපගේ යාච්ඤාවයි. මෙම සේවය ඉදිරියට ගෙන යෑම උදෙසා ඔබ සැමගේ යාච්ඤාව හා උපකාරය නොඅඩුව ලබා දෙනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

ඉහත බයිබල් පදය අපට බොහෝ දේ උගන්වයි. ප්‍රධාන වශයෙන් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම නොහොත් ඇදහිල්ලෙන් ජීවත් වීමට ධෛර්යය දෙයි. ඇදහිල්ලේ විරුද්ධාර්ථය සැකයයි. සැකය ඇති තැන ඇදහිල්ලට ඉඩක් නැත. අද බොහෝ කිතුණුවන් ජීවත් වන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි සැකයෙන් ය. එනම් ඇදහිල්ලෙන් තොරවයි. මානසික ශාරීරික හා ආත්මික පීඩනයක් සැකය කරණකොටගෙන හටගනියි. සාමය, සතුට, ප්‍රීතිය හා ආශිර්වාද ජීවිතයෙන් පලායයි. 1 යොහන් 5:4 අනුව අප මේ ලෝක යෙන් ජයගත හැක්කේ ඇදහිල්ලන්ය. කිතුණුවා නිරන්තර යෙන් යුද්ධයක පැටලී සිටියි. යක්ෂයා, මාංශය හා ලෝකාකාරයට එරෙහිව කිතුණුවා යුද්ධ කරයි. එය බොහෝවිට හදවතේ යුද්ධයකි. මෙම යුද්ධය ජයගත හැක්කේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ය. දේව වචනයේ තිබෙන පොරොන්දු විශ්වාස කිරීමෙන් හා යේසුස්වහන්සේ ගේ ප්‍රේමය කරණකොට ගෙන අපට පැමිණෙන ඕනෑම පීඩාවක් ජය ගත හැක. (1 පේතෘස් 1:4) (රෝම 8:37).

වත්මන් කිතුණු ජනයා වියවුල් භාවයට පත්වී ඇත්තේ ඇදහිල්ල වෙනුවට මනුෂ්‍ය මත වලට ප්‍රමුඛස්ථානය දීමෙන්ය. මිනිසා විසින් ඉදිරිපත් කරන සංකල්ප හැම විටම ඇදහිල්ල සැකය බවට හැරීමට තිබෙන සම්භාව්‍යතාවය වැඩියි. නවීන තාක්ෂණික මෙවලම් නිසා ඕනෑම භාෂාවකින් ඉදිරිපත් වෙන සංකල්පයක් එවලේම තම අතට පත් වේ. facebook, youtube හා අන්තර් ජාල විවිධ ක්‍රමමගින්. මනුෂ්‍ය සංකල්ප පැතිරීමේ

වේගය සීඝ්‍රගාමී වී ඇත. එයින් දෙවියන් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ලට ඇති කරන බලපෑම සුළු පටු නොවේ.

මුළු සමාජයම මනුෂ්‍ය සංකල්ප හා මත වල් පැටලවී මං මුලා වෙමින් රැවටෙමින් එක තැන පල් වෙමින් පවතී, බයිබලය එය මෙසේ සඳහන් කරයි. **"නමුත් නපුරු මනුෂ්‍යයොත්, රැවටිලිකාරයොත් රවටමින්ද රැවටෙමින් ද වඩ වඩා නරක් වන්නෝය."** (2 තිමෝති 3:13). කිතුණුවන් ද මෙම උගුලට හසුවී හමාරය. එබැවින් එයින් ගැලවී දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වීම ආශිර්වාදයේ හා ජයග්‍රහණයේ මාවතයි.

## දේව වචනය නොහොත් බයිබලය ඇදහිල්ලෙන් භාර ගැනීම

ලෝකයේ පටන් ගැන්මේ සිට සිදුවූ සියල්ල වාර්තා කර තිබෙන පොත බයිබලයයි. එහි සඳහන් සියල්ල සත්‍ය හා විද්‍යාත්මක බව පිළිගැනීමට ඇදහිල්ල අවශ්‍යය. "දෙවියන්වහන්සේගේ වචනයෙන් ලෝකවල් මවනු ලැබූ බවද මෙසේ දකින දේවල් පෙනෙන දේවල් වලින් හට නොගත් බවද ඇදහිල්ලෙන් තේරුම් ගනිමු." (හෙබ්‍රෙව් 11:3)

මේ ආකාරයෙන් විශ්වයේ ආරම්භය ඇදහිල්ලෙන් තේරුම් ගත යුතුව ඇති අතර මිනිස් ජීවිතයට අයිති අන් සියල්ල ද ඇදහිල්ලෙන් තේරුම් ගත යුතුව ඇත. මහා පිපිරීමකින් විශ්වය බිහිවූ යැයි මහා බොරුවකින් මිනිසා මුලා කිරීමට කාලයක් උගත් යැයි සැලකෙන පිරිසගේ උත්සාහයක් තිබූ අතර මිනිසා පැවතෙන්නේ වඳුරාගෙන් යැයි තවත් උගත් මෝඩයෙකු විසින් සංකල්පයක් ගෙනවිත් ලෝකයා මුලා කළේය. මේ ආකාරයේ දිනපතා දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල වලකාලීම පිණිස මිනිස් සංකල්ප ප්‍රකෝටි ගණන් දිනපතා සමාජය වල්මත් කරයි.

## ඇදහිල්ලන් ගැලවීම ලැබීම

මනුෂ්‍ය සංහතියේ ප්‍රධාන ප්‍රශ්නය වන මරණින් පස්සේ මිනිසාට කුමක් සිදුවේ ද? මිනිසා පව්කමාව ලබා ගන්නේ කෙසේ ද? විමුක්තිය කරා ගමන් කරන්නේ කෙසේ ද? මේ පිළිබඳව තිබෙන බොරු මතවාද හා සංකල්ප පිළිබඳ පොත් කඳු ගනන් ලියවී ඇත. සැබෑ විමුක්තිය ළඟා කරගත හැක්කේ ඇදහිල්ලෙන් බව විශ්වාස කිරීම වෙනුවට තම උත්සාහයෙන් ගැලවීම ලබාගැනීමට දරණ කෝටි ගණන් ජනතාව මුලා වී ඇත. **"යේසුස්වහන්සේ කෙරෙහි අදහා ගනින්න. එවිට නුඹ ගැලවෙන්නෙහිය"** (ක්‍රියා 16 : 31). දේව වචනයේ සඳහන් සහතිකය ඇදහිල්ලෙන් පිළිගැනීමෙන් ඕනෑම කෙනෙකුට මරණින් පසු සදාකාල සදාකාල ජීවනයට ඇතුල්වීමට හැක.

## ඇදහිල්ලෙන් පීඩා ජයගැනීම

කිතුණුවන් හට දිනපතා මුහුණ දීමට සිදුවන පීඩා හා අසනීප, සතුරු කරදර හෝ වෙනත් ඕනෑම පීඩාවන් ජයගැනීමට ඇදහිල්ල කරණකොට ගෙන හැක. අධෛර්යමත් වීම හා සභාව තුළින් හට ගන්නා කලකිරීම්, පීඩා වැනි කිතුණුවා දිනපතා මුහුණු දෙන සුලභ ලොකු කුඩා ප්‍රශ්ණ සියල්ල ජය ගැනීමට ඇදහිල්ලට හැකිය. ඇදහිල්ලෙන් ගැලවීම ලැබූ අප ඇදහිල්ලෙන් ජයග්‍රාහී ජීවිතයක් ගත කිරීමට දෙවියන්වහන්සේගේ කරුණාව ඔබ සියල්ල කෙරෙහි උදාවේවා!

**සංස්කාරක - එස් මෙත්තානන්ද -**
**077 8813197**

# ඒවගෙන් පාඩම්



පොළවේ පළමුවන පාපය කළේ කාන්තාවකි. ඇය මුල්ම ස්ත්‍රිය වන ඒවය. සාතන්ගේ මුළාවට රැවටුන ඈ දෙවියන්වහන්සේගේ ආඥාව කඩ කළාය. එය එතැනින් කෙළවර නොවීය. සිය පුරුෂයාටද ඇය තහනම් කළ ගහේ ගෙඩි දුන්නාය. තහනම් ගස පිළිබඳව තුන් ආකාර හැඟීම් ඈ තුළ පහළ විය.

1. කෑමට හොඳ බව
2. ඇස් වලට ප්‍රිය බව
3. නුවණ ලැබීමට ආශාව

මෙම කරුණු තුනම තවත් ආකාරයකින් 1 යොහන් 2 හි සඳහන් වේ. "මක්නිසාද, ලෝකයේ තිබෙන සියල්ල,
එනම්,

i. මාංශයේ තෘෂ්ණාව
ii. ඇස්වල තෘෂ්ණාව
iii. ජීවිතයේ අහංකාර කම

පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ." ගුවන් විදුලියෙන් හෝ පොත පතකින් හෝ ඔබට කතා කරන්නන්ගෙන් හෝ යම් යම් දේව වචනයට එකඟ නොවන ලෞකික දේවල් වර්ණනා කෙරෙන විට ස්ත්‍රීන් තුළ ඒවාට තෘෂ්ණාව ඇතිවීමට පටන් ගනී. තහනම් ගහේ වර්ණනාව අසා සිටි ඒව තුළ ද සිදු වූයේ මෙයයි. ඊළඟට ඇය ඕනෑකමින් ගහ දෙස බැලුවාය. ඒ ගහේ එල වලින් ඈ මත් විය. විවිධාකාර ලෞකික දේවල් දකින කාන්තාවන්ගේ ඇස් ඒ කෙරෙහි ආශාවෙන් මත්වේ. මේ ගෙඩි කෑමෙන් තමාට දෙවියන් වහන්සේ හා සමාන නුවණක් ලැබීමට හැකි වේයයි සිතන ඈ තුළ අහංකාරය හිස ඔසවයි. දෙවියන්වහන්සේගෙන් ලැබුණ තත්වයට වඩා ඉහළ ස්ථානයක් ලබා ගැනීමට දේව වචනයට පටහැනි ලෞකික මාර්ගවලට ආශා නොවිය යුතුය. ආත්මික වශයෙන් ද මේ පරීක්ෂාව පැමිණිය හැකියි. තමා සිටින තත්වයෙන් වඩා ඉස්මතුකර දැක්වීමට පෙළඹීමද මාංශික තෘෂ්ණාවයි. අන් අයගේ සැප සම්පත් දකිනවිට ඇස්වල තෘෂ්ණාව ද හට ගනියි. ඊළඟට තමා ඉස්මතු වීම පිණිස සිටින තත්වයට වඩා උසස් ස්ථානයක්, හෝ තනතුරක් ගැනීමට

හෝ කැපී පෙනීමේ සේවයකට හෝ ආශා උපදවා ගනී. එය ආත්මිකව අහංකාරකම ද වෙයි.

වරදක් කරන ස්ත්‍රිය අන් අයවද ඊට පොළඹවා ගැනීමට උත්සාහ ගැනීම ලෝකයේ පිළිවෙලක් මෙනි. එවිට තමා කළ වරද බෙදී යාමක් වේ යයි සිතනවා ඇත. තම පුරුෂයන්ට තහනම් ගෙඩි කෑමට දීම ද ඇතැම් ස්ත්‍රීන්ගේ සිරිත ය. ඇතැම් පුරුෂයන් ද ආදම් වගේ තම ආදරවන්ත බිරිඳගෙන් ලැබෙන තහනම් ගෙඩි කා දමයි. (බිරිඳ කියන ඕනෑම දෙයක් පිළිගැනීම) දෙවියන් වහන්සේ ප්‍රශ්න කරන විට ඒවා දුන් පිළිතුර කුමක් ද? "සාතන් මා රැවටුවේ ය." මෙය ඉතා පහසු පිළිතුරක්. වරදට වැටෙන ස්ත්‍රිය ඊළඟට පවසන්නේ "සාතන් මාව පරීක්ෂාවට වැට්ටුවා" කියාය. පරීක්ෂාව පාපය නොවේ. එයට වැටීම නම් පාපයයි. යොහන් තුමා මෙසේ සඳහන් කරයි. **"මාගේ ප්‍රිය දරුවෙනි නුඹලා මුළා කරන්ට කිසිවෙකුට ඉඩ නොදෙල්ලා"** (1 යොහන් 3:7) **"දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින කිසිවෙක් පව් කරන්නේ නැත. මක්නිසා ද ඔහු තුළ උන්වහන්සේගේ බීජය පවතින්නේ ය. දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින බැවින් පව් කරන්නට ඔහුට නුපුළුවන"** (1 යොහන් 3 : 9)

ඇදහිලි වන්ත ස්ත්‍රීන් මෙසේ ඒවගේ තත්වයේ නොසිට දෙවියන්වහන්සේට ප්‍රිය වූ අලුත් ගිවිසුම් ස්ත්‍රීන් මෙන් සිටින පිණිස මෙම ලිපිය උපකාරී වේවා!

**- තබීතා -**



**"පාපය සුළුකොට සිතන්නාට දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අත්දැක නොහැක"**

# ඔබට බැරිද මෙහෙම වෙන්න

ශුද්ධ බයිබලයේ එන කදිම චරිතයක් ගැන අද ඔබ සමඟ කථාකරන්න කැමතියි. ඇදහිල්ලෙන් හා ශුද්ධාත්මයෙන් පූර්ණ වූ (ක්‍රියා 6 : 5) අනුග්‍රහයෙන් පූර්ණ වූ සෙනඟ අතරේ පුදුමද හාස්කම් ද කළාවූ (ක්‍රියා 6 : 8) ස්තේපන් මේ චරිතයයි.

ඔහුගේ ආශීර්වාද ලත් ජීවිතය ගැන බලන විට උපස්ථායකයන් සත් දෙනාගෙන් එක් කෙනෙකු වීමේ භාග්‍යය හා යේසුස්වහන්සේගේ ශුභාරංචිය උදෙසා ප්‍රාණය යාග කළ ප්‍රථම දේව දාසයා වීමේ වරප්‍රසාදය ඔහු ලැබුවේය.

අළුත් ගිවිසුමේ මෙපමණ දීර්ග පණිවුඩයක් එකවර කතාකරන මනුෂ්‍යයෙක් නැති තරමයි. ඔහුගෙන් අපට තිබෙන ආදර්ශය කුමක්ද ?

ඔබත් මමත් ගැලවීම ලබන්නේ පව් ගැන පසුතැවිලිව ගැලවුම් කරු ලෙස ස්වාමීවූ යේසුස් වහන්සේ අදහා ගැනීමෙනුයි. ඔබ හිතන්ට පුළුවන් ප්‍රාණ පරිත්‍යාග කරන්න ඔහුට විශේෂ බලයක්, නිර්භීත කමත් තිබුණා කියා.

ස්තේපන් ලැබුවෙත් ඔබ ලැබූ ගැලවීම මයි. ඔහු ජීවිතයේ ශුද්ධකම තරුණ වියේ අකුරටම රැකගත් ඇදහිලිවන්තයෙකු වුණා. **"නුඹලා ලෝකයට අයිති නම් ලෝකයා තමුන්ගේම අයට ආදරේ වන්නෝ ය. නමුත් නුඹලා ලෝකයාගෙන් නොවන නිසාත් මා විසින් නුඹලා තෝරාගත් නිසාත් ලෝකයා නුඹලාට වෛර වෙතියි."** (යොහන් 15:19) යේසුස්වහන්සේ කී වචනය ද නැවත ලූක් 12:4 "මාගේ මිත්‍රයෙනි, ශරීරය නසා එයින් පසු වෙන කිසිවක් කරන්නට බැරි අයවලුන්ට බය නොවෙල්ලා යයි උන්වහන්සේ කී වචනය ද ක්‍රියාවේ යොදවමින් ස්තේපන් ජයාන්විත ජීවිතයකට සදහටම ඇතුළත්විය.

ගැලවීම ලත් ක්‍රිස්තියානි කාරයෙකුට ඔහුගේ ජීවිතයේ ආත්මික ජයග්‍රහණය කරා යන්නට ලැබෙන පුහුණුව තමයි පීඩාව කියන්නේ. අපි ලෝකයේ අනෙක් මිනිසුන් මෙන් පාපයේ ජීවත් වෙත්දීත් අපට පීඩා, කරදර පැමිණුන බව ඇත්ත, නමුත් ක්‍රිස්තියානි ජීවිතයේ පීඩා මැද ජය සහතිකයක් අපට තිබීම වැදගත්, එවැනි බලාපොරොත්තුවක් ලෝකයේ අයට නැහැ. ඔවුන් කරදර පීඩා තුළ මිරිකෙමින් හිරවෙනවා පමණයි. **"යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වන්ට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය"** (2 තිමෝති 3 : 12). අපට කියන්නේ එය දෙවියන්වහන්සේ දක්නා දෙයක් බවයි.

බොහෝ අය ගැලවීම ලබාගෙන එතනින්ම ගමන නතර කර ගන්නේ පීඩා වලින් ජය ලැබීමට ඇති පසුබට වීම නිසයි. දෙවියන් වහන්සේට ස්තුති වන්නට ස්තේපන් වින්ද තරමේ පීඩා විඳින්ට අප රටේ නැහැ. නමුත් ලෝකයේ චීනය, ඉරානය, ඉරාකය, සිරියාව වගේ රට වල නිතරම යේසුස් වහන්සේ ඇදහීම, ප්‍රකාශ කිරීමේ වරදට සිර බත් කන, දඬුවම් ලබන, ස්තේපන් මෙන් ජීවිත පූජාවලට ලක් වෙන ක්‍රිස්තියානීන් ඕනෑ තරම් සිටිනවා.

ඔබට තිබෙන පීඩා බොහොම සුළු ඒවා. ශාරීරික පීඩා විඳින්නට ඔබට සිදු වී නැහැ. සමහරවිට වැඩ පලේ, ගමේ, ගෙදර අය දොස් කියාවි. නැත්නම් ශාප කරාවි. හෙළා දකීවි. ඔබ මේ දෙවලට භය නම් කොහොමද අර ස්තෙපන් වගේ මනුෂ්‍යයෙක් වෙන්නෙ? රෝම 8:37 සිට 39 දක්වා ඇති ලක්ෂණ ස්ථිර සාර අත්දැකීම ඔබටත් ඉවසිල් ලෙන් හා මුහුණ දීමෙන් ලබන්ට මම ඇරයුම් කරමි. මිතුරන්ගේ සරදම් වලින් ඔබේ ගැලවීම සුළු නොකරන්න. ආගම් නායකයන්ගේ භය ගැන්වීම් වලින් හැකිල යේසුස්වහන්සේව අත්හරින්න තරම් ඔබ බොළඳ ඇදහිලිවන්තයෙක් වෙනවා දැයි මේ දැන් ඔබේ සිතට තට්ටුකර විමසා බලන්න. එබඳු සෙලවෙන සිතකින් යම් යම් දේ දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න ඔබට පුළුවන් ද?

**"ලෝකයෙන් නුඹලාට පීඩා තිබේ. ධෛර්යවත් වෙයල්ලා, මම ලෝකයෙන් ජයගතිමි "** යි (යොහන් 16:33) කියන යේසුස් වහන්සේ ගැන හෙබ්‍රෙව් 4 : 15 මෙසේ කියයි. **"අපට සිටින්නේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව, සියලු ආකාරයෙන් ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක් ය."**

ඔබව පීඩා නැමති උඳුනක දමා රන් මෙන් දෙවියන්වහන්සේ පවිත්‍ර කර සකස් කරන්නේ සදාකාල ජීවනයේ සිංහාසනයක තැබීමට බව අමතක නොකරන්න. ඔබටත් ස්තේපන් මෙන් නිර්භීත අවංක ශුද්ධ ක්‍රිස්තියානි කාරයෙකු වීමට ස්වාමී වූ යේසුස් වහන්සේ ආශිර්වාද කරන සේක්වා!

**කියවීමට :**
**1 පේතෘස් 1 : 7 - 8**
**2 කොරින්ති 11 : 23 - 33**

**ජීවිතය ප්‍රතිසංස්කරණය කළ හැක්කේ යේසුස්වහන්සේට පමණි.**

# රෑ ඩැනියෙල් දවල් මිගෙල්



උත්පත්ති 13 පරිච්ඡේදයේ 1 සිට 18 දක්වා වූ පද කියවා බලන්න. ආබ්‍රහම් තම නෑයා වූ ලොත් සමඟ මිසර දේශයෙන් පිටව දකුණු දෙසට නික්ම යනු පෙනෙයි. ශුද්ධ ලියවිල්ල “මිසරයෙන්” හඟවන්නේ “ලෝකය” යි. “පොරොන්දු දේශ යෙන්” හඟවන්නේ “ආත්ම පූර්ණ ජීවිතයයි” යි. ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ කැඳවීමට අනුව මිසරය අත්හැර ලොත් සමඟ ඉදිරියට යමින් සිටී. ඔහු සියල්ලෙන් පොහොසත් ය. ඔහු “බෙතෙල්” නම් ස්ථානයට ළඟා වෙයි. බෙතෙල් යනු දෙවියන්වහන්සේගේ ගෘහයය. එහි මේ ඇදහිලිවන්ත මනුෂ්‍යයා තම කූඩාරම සාදා ස්වාමීන්වහන්සේට පූජා පවත්වමින් නමස්කාර කරයි. ඔහු තුළින් ස්වර්ගික බලාපොරොත්තු අතර ඉහළ බලන ජීවිතයකුත් ලොත් තුළින් පොළොවෙහි මාංශික තෘෂ්ණාවට රැවටී මුළාවන තවත් ජීවිතයකුත් සංඛේතවත් වෙයි. දෙදෙනාටම එළු බැටළු සම්පත් තිබිණි. එහෙත් 13 : 6 පදය කියවන අප දකින්නේ එකට වසන්නට බැරි තරමට ඔවුන් දෙදෙනාගේ භූමික සම්පත ඔවුන් දෙදෙනා වෙන් කිරීමට අර අදින බවය. ආබ්‍රහම්ගේ ජීවිතය අර්ථවත් වූත් විවෘත වූත් එකකි. ඔහුගේ නමේ අර්ථය “සමූහයක පියා” යන්නය. එහෙත් මාංශික කැමැත්තට රුචිවන ලොත් සොදොවේදී සිය සැබෑ ස්වරූපය සඟවයි. එබැවින් නිතරම ඔහු පරාජිතයෙක් වනු අපට පෙනේ. “ලොත්” යන නමෙහි අර්ථය වන්නේ “වැස්ම” යන්නයි. සැබවින්ම ඔහු තම සැබෑ ස්වරූපය වසා ගනිමින් ව්‍යාජ චරිතයක් රඟපා පෙන්වයි. ඇදහිළිවන්තයෙකුට මෙබඳු රැවටිලි කරුවකු විය නොහැක. එසේ වුවහොත් ඔහුම රැවටෙයි.

## වැසුණු ජීවිතයක්

සොදොම හෙවත් පාපයේ නගරයෙහි ලොත් ජීවත් වන්නේ මුඛය පියාගෙනයි. එහි වරද ඔහු නොදකින් නාක් මෙන් දෑස් වසා ගනී. (2 පේත්‍රුස් 2:8) ඇදහිල්ලේ ජීවිතය මෙය නොවේ. තම ජීවිතයෙන් දේව වචනයෙන්, ක්‍රියා මාර්ග වලින් දේව දරුවා පිරිසිදු ජීවිතය හා පාපයේ සබඳකම අතර ඇති වෙනස ලොවට කියාපායි. එය එසේ නොවූ තැන භූමික පරීක්ෂාව විසින් දේව දරුවාගේ දෑසද රවටා පරීක්ෂාවෙහි සඟවා තබා ගැනීමට ඉක්මන් වෙයි. පාපයේ හැසිරෙන ජනතාවගේ වරදත් එහි

බිහිසුණු ප්‍රතිඵලයත් දකිමින්ම ලොත් වැස්මත් යටතේ සිටී. ඔබගේ ද යුතුකම වන්නේ වැස්මක් දමාගැනීම නොව ඇදහිලි වන්තයාගේ යුතුකම අවංකව ඉටු කිරීමය. ලොත්ගේ ඇදහිළි ජීවිතයේ ඇත්තේ පරාජිත තත්වයකි. ඔහු අමාරුවට පත් වෙයි. එහෙත් ස්වාමීන්වහන්සේ ඔහු ගැළවූ සේක. ඇදහිළිවතෙකු තම වරදින් පාපයේ පහසට භුක්තිවිඳ එහි අනිසි විපාක ලැබෙන විට දෙවියන්වහන්සේම තමන් ගළවයි. විශ්වාස කරයි. එය වැරදියි. ලොත් සාක්ෂි කරුවකු වී නම් ඔහුගේ ජීවිතය පළමුව එළියවී පාපයේ ජීවත් වන්නවුන්ටද එළිය පාදා දෙනු ලැබීමට ඉඩ තිබුණි. ඔහු ලුණු රස නැති ලුණු මිටක් බඳුය. මෙබඳු ඇදහිලිවතුන් ද අප අතර විරළ නැත. යේසුස්වහන්සේ අදහන, ගැළවීම පිළිගන්නා සමහරෙක් ලෝකයත්, ජීවිතයත් අතරේ වෙනසක් නොදැක්වීම ලොත්ගේ ජීවිතය හුවා දැක්වීමකි.

ආබ්‍රහම් යන ගමන ලොත්ට අමතක වෙයි. උත්පත්ති 13:10 බලන්න. "ලොත් ඇස් ඔසවා බලා යොර්දානේ මුලු සම භූමිය හැම තැනම සරුසාරව, හොඳව තිබෙන බව දුටුවේය. ස්වාමීන්වහන්සේ සොදොම හා ගොමොරා විනාශ කරන්ට පළමුවෙන් ඒක ෂොවර් දෙසට ස්වාමීන්වහන්සේ ගේ උයන මෙන්ද මිසර දේශය මෙන්ද වූයේය." ලොත් මතුපිට සම්පත් දකිමින් දේශයට රැවටෙයි. එය ඔහුට දෙවියන් වහන්සේගේ උයන මෙන් පෙණෙයි. එහිම නතර වෙමින් ගමන අඩාල කරගන්නට ඔහු සැරසෙයි. ප්‍රිය හිතවත, හිතවතිය, ඔබ ගැළවීම ලබා යේසුස්වහන්සේගේ ලේවල මිලයට යටත්වූ පසු ඔබ ඔබටම අයිති නැත. උන්වහන්සේට ඔබ අයිති වී ඇත. එසේ වූ තැන යළිත් භූමික දෙයින්, මිල මුදලින්, ගෞරව නාමයෙන් ඔබේම අයිතියට යමක් ඔබ ලබා ගැනීමට තැත්කරන විට ඔබ බඩට සේවය කරන තත්වයට පත්වෙයි. ලොත් මෙන් දකින දකින දෙයට ප්‍රියව ඇස්වල තෘෂ්ණාව විසින් ගමන් මග වෙනස් කරනු ලබයි. ප්‍රවේශම්වන්න.!

ආබ්‍රහම්ගේ පදිංචිය අනේර් ගේ සහෝදරයා වූ මම්රේගේ ආලෝන ගස යට පිහිටුවා තිබිණ. උත්පත්ති 14:13 බලන්න. මම්රේ යනු ශක්තිය ජනිත කිරීම යන අර්ථයයි. අනේර් යනු ප්‍රීතිය පිරවීමයි. මේ ස්ථානයේ සැබවින්ම සාමය තිබේ. එය දෙවියන්වහන්සේගේ ගෘහයයි. එහෙත් ලොත් පිටාතර පෙනීම අතරේ අසමාදාන ජීවිතයක් ගෙවයි. ඔහුගේ ගෙදර සම්පත් සමඟ ලොත් හා බිරිඳද වාලට අසුවිය (14:12 හා 14:16). එහිදී ඔහුට පිහිට වන්නේ ස්වර්ගීය සම්පත දෙස බැලූ ආබ්‍රහම් මිස වෙන කිසිවකු නොවේ. ඔහුට විරුද්ධව සටන් ඇවිලුන මොහොතේ ලොත්ට ශක්තිය දීමට කිසිවකු ඔහු සමග සිටියේ නැත. අපට කෙසේද? ලොත් මෙන් සටනේ දී අපත් අසරණව සාතන්ගේ වාල් කමට හසුවනවාද? නොඑසේ නම්?

## සතුරාගේ පහර

සතුරාට විරුද්ධව සිටීමට අවශ්‍ය ඇදහිල්ලේ බලය අප පවුල තුළ තිබේද? මිල මුදල් තිබෙන්නට පිළිවන. එහෙත් ඇදහිල්ලේ බලය එහි අඩංගු නොවේ. ගෙදර ස්ථාවර තාවයක් තිබේ ද? යාච්ඤාවෙන් පවුලේ දරුවන් සමඟ පොර බදනවාද? සභාවේ, ගෙදර අපට ශක්තිය උපදවන යමක් තිබේද? ලොත්ට විරුද්ධව සතුරා පැමිණෙන්නේ ඔහු බලයෙන් හීනව සිටින විටයි. එහෙත් දේව කැමැත්ත හා මඟ පෙන්වීම ආබ්‍රහම්ට තිබේ. යුද්ධයට යන පිළීවෙල ඔහු උගනියි. තමාගේ ගෙදර වූ වැඩ කරුවන් 318 දෙනාට ඔහු ශිල්ප ප්‍රගුණ කරවයි. සැබෑ ඇදහිලිවන්තයාගේ තත්වය මෙයයි. කෙබඳු අවස්ථාවක හෝ සටන බලාපොරොත්තුව තමා එයට සැරසෙමින් පවුල ශක්තිමත්ව ඊට මුහුණ දීමට පුහුණු කර ගනී. ආබ්‍රහම් ලොත් බේරාගත් පසුවත් මිසරිය සිතුවිලි හා ලෞකික ආශාවලින් ඔහු සම්පූර්ණයෙන්ම නිදහසක් නොලබයි. උත්පත්ති 19:1 කියවන විට අපට හමුවන්නේ දොරටුවේ විනිශ්චය කරන්නකු ලෙස නාමයේ ගෞරවයට ආශාවන ලොත් එහි වාඩිලා බලා සිටින බවය. තමාගේ ආශාව තවමත් සොදොම කෙරේ ඔහු තබයි. අවසානයේ සියලු සම්පත් අතහැර යාමට ඔහුට සිදුවෙයි. තම බිරිඳ පවා අහිමිව වස්තුව වේදනාවෙන් පසෙකලා, දිවි ගළවා ගැනීමට දුවයි. (උතපත්ති 19:29) දූවරුන් සමඟ සබඳ වී පරම් පරාව පවා කිළිටි කරගනී.

## වියගහ යටින්

ආබ්‍රහම් පිළිගැනීමට සොදොමේ රජු තෑගි පෙරටු කරගෙන පැමිණෙයි. (උත්පත්ති 14:17) "රජුගේ මිටියාවත නම් ස්ථානයට ආබ්‍රහම් පැමිණි සිටී. මතෙව් 11: 29 රජුගේ මිටියාවතේ සවරූපය යේසුස් වහන්සේ උගන්වන සේක. සිතින් යටත්ව සිටින තැන රජුගේ මිටියාවතයි. අපි යේසුස්වහන්සේගේ වචනයට කීකරු වීමට ඉගෙන ගනිමු. එහිදී අපි පරාජය වන්නේ නැත (ගීතාවලිය 31:1). සොදොමේ රජුගේ තෑගි අවශ්‍ය නැත. අපේ ඇදහිල්ල තෑගි - මුදල් පිට නොවේ. ආබ්‍රහම් නොරැවටී තෑගි ප්‍රතික්ෂේප කරයි. උසස්නාමය, වස්තු ආදියෙන් අප රැවටීම සාතන්ගේ කැමැත්තයි. 2 සාමුවෙල් 18:18 අබ්සලොම් තම නාමයේ උසස් බව රැකීමට කුළුණක් තනයි. මෙබඳු පරීක්ෂාවලින් අපි ප්‍රවේශම් වෙමු. අපට ක්‍රිස්තුස්වහන්සේ තුළවූ පාපයෙන් ජයග්‍රහණය කිරීමේ බලය තිබේ. අපි දෙලොවක් අතර හිරනොවී අපේ පොරොන්දුව ගැන ස්ථිර වෙමු. **"අපේ නාගරිකත්වය ස්වර්ගයෙහි ය"** (පිලිප්පි 3:20).

**- හොරණෑ හඬ -**

# නීතිගරුක වීම තුළින් ස්වාමීන්වහන්සේගේ ප්‍රසාදය

**වරක් නුඹලා අන්ධකාරව සිටිය නමුත් දැන් ස්වාමීන්වහන්සේ තුල ආලෝකයව සිටින්නහුය. ආලෝකයේ දරුවන් මෙන් හැසිරී-යල්ලා** (එපීස 5 : 8).

නීතිරීති කැඩීම අපට ජන්ම යෙන්ම උරුම වූ ගති ලක්‍ෂණයකි. එය මනුෂ්‍ය සංහතියේ ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ මනුෂ්‍යයා තුලින් දුටු පොදු ගති ලක්‍ෂණයකි. නීතියට අකීකරු වීම, සමහර අයට අභියෝගයකි. නීතියට පිටින්, හොරෙන් කර, එය හසුනොවී සිටීම සමහර අයගේ උද්ධාමයට හේතුවේ. "ලොකු වැඩක් කලා" යන හැඟීමෙන් ප්‍රීතිමත් වීමට හේතුවක් කර ගනියි.

බලපත්‍ර නැතිව වාහන, යතුරුපැදි පැදවීම, හෙල්මට් නැතිව, ගමන් කිරීම වාහනයට අවශ්‍ය ලිය කියවිලි නැතිව වාහනයක් ධාවනය කිරීම සිට හොර රහසේ අන් භාර්යාවන් සමඟ සයනය කිරීම මිනී මැරීම දක්වා නීතිය කැඩීම, හා "හොරෙන්" කිරීම දුරදිග ගොස් එය මනුෂ්‍යයාට හුරුපුරුදු වී ඇත. "හොරෙන් කන කෑම රස වැඩියි" යන පාඨයට සරිලන සේ හොර වැඩ කිරීමට අප සමාජය කොයිතරම් ඇබ්බැහි වී ඇත්ද?

හොර ලියකියවිලි සැදීම, හොර ඔප්පු සැදීම, හොර මරණ සහතික සැදීම, (තවමත් ජීවත්වන අයට) දිනපතා මනුෂ්‍යාට අවශ්‍ය සියලුම ආකාරයේ මෙවැනි ලියකියවිලි සුදුසු කම් නැතිව නීතියට පිටින් නිෂ්පාදනය කිරීම පිළිබඳ වාර්තා ජනමාධ්‍ය තුලින් නිතර අපට දක්නට ලැබේ.

විවිධ ව්‍යාජ ආයතන, මූල්‍ය ආයතන, සෞඛ්‍ය ආයතන ව්‍යාජ වෛද්‍යවරු ගමේ ගොඩේ හොර අරක්කු, මේ ආකාරයේ මුළු සමාජය ව්‍යාජ ක්‍රම උපායයන් ගෙන් වෙලා ගෙන ඇත. මෙය "වරදක් නොවේ" යන මතය දරණ අයද ඇත.

ප්‍රිය මිතුර මිතුරියනි, මෙම ක්‍රමය පිළිබඳ ඔබගේ අදහස කුමක්ද? හරිද? වැරදිද? කමක් නැද්ද? අදහසක් නැද්ද? කිතුණුවන්ට මෙය අකැපය. දේව වචනයේ නිරන්තරයෙන්ම අපට උගන්වන්නේ රටේ, ආයතනයේ, පවතින නීතිරීති වලට කීකරුව, අවනතව නීතියට ගරු කරමින් හා ආරක්ෂාකමින් ජීවත් වීමටය. නීති කැඩීම පාපයක් ලෙස හැඳින්වීම වරදක් නොවේය.

නීතියට පිටුපා තම කාර්යය ඉටුකිරීම උදාහරණයක් ලෙස හෙල්මටයක් නොපැළඳ පොලීසියට

හසු නොවී ගමන් ගොස් පැමිණීම, තම ලද ජයග්‍රණයක් ලෙස කිතුණු ඔබ නොසලකන්න. එය පසුතැවිලි වීමට කාරණයක් මිස සතුටු වීමට කාරණයක් නොවේ. මෙය සුළු උදාහරණයකි. මේ ආකාරයේ කිතුණුවන් වන අපද මේ පරික්ෂාවන්ට වැටෙන අවස්ථාවන් ඇත. ප්‍රවේසම් වන්න. අපහසු අමාරු කාර්යයන් වලදී අවංකව අව්‍යාජව කටයුතු කිරීමත්, ඒ සඳහා ස්වාමීන් වහන්සේගේ උපකාරය ඉල්ලා සිටින්න. මක්නිසාද අප යේසුස්වහන්සේ අපගේ ස්වාමීන්වහන්සේ ලෙස පිළිගත් දවසේ ම උන්වහන්සේ අප තුළට ඇතුල් වී අපගේ වංචාකාරී ස්වභාවය වෙනස් කිරීමට ක්‍රියා කරන සේක. උන්වහන්සේ ඊට සමත්ය.

බොහෝ මෙවැනි නීතියට පටහැනිව ක්‍රියාකිරීමට පෙළඹෙන්නේ තරුණ පරපුරේ අයය. තරුණයනි, තරුණියනි, ස්වාමී වූ යේසුස්වහන්සේගේ ගෞරවය සොයන්න. දිවි පුදා, ඔබ මුදවාගත් යේසුස්වහන්සේ තම ලෙයින් ඔබව මිලදී ගෙන ඇත. එබැවින් මේ තාවකාලික වාසිය තකා සදාකාලික යේසුස්වහන්සේට අගෞරව නොකරමු. දේව වචනය අපට අවවාද කරනුයේ නීතිගරුක වීමටත් අවංක වීමටත් ය. කිතුණුවන් අතින් සිදුවන නීතිරීති, කඩන අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- කාර්යාලයේ දී වැරදි වෙලාවක් සටහන් කිරීම (එන/යන)
- කාර්යාලයේ, උපකරණ, ටෙලිෆෝන්, ලිපිද්‍රව්‍ය, පුද්ගලික පරිහරණය හා ගෙදර ගෙන ඒම.
- කෑම වෙලා, තේ වෙලාව වැඩිපුර වැය කිරීම.
- වාහනය පදවන විට නියමිත වේග සීමා උල්ලංගනය කිරීම.
- පොලිස් නිලධාරීන් නැති අවස්ථා වල දී මාර්ග නීති කඩ කරමින් අන් අයට කරදරයක් වන ආකාරයට වාහනය ධාවනය කිරීම.
- රක්‍ෂණ, සහතික, වලංගු බලපත්‍ර, නොමැතිව ධාවනය කිරීම.
- නියමිත ආසන ප්‍රමාණයට වඩා පටවා ගැනීම.
- යතුරු පැදි ධාවනයේ දී හෙල්මට් පැළඳ නොසිටීම.
- වරදක් කර අහුවුවහොත් අල්ලස් දී බේරීම.
- රාජ්‍යය කාර්යය වලදී අල්ලස් දී තමන්ගේ වැඩය ඉක්මනින් කර ගැනීම.
- රෝහලේ දී, අන්තැන්වලදී පෝලිම පැනීම.
- අන් අය අපහසුතාවයට පත් වන ක්‍රියාවන්, කතාවන් විහිළු, වාහන නැවැත්වීම, ගුවන් විදුලි රූපවාහිණී යන්ත්‍ර දැමීම වැනි බොහෝ දේ.

මේ ආකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේ ගෞරවය කෙලෙසීමට ඉඩ නොතබන්න. ස්වාමීන්වහන්සේ ඔබට, ආශීර්වාද කර උපකාර කරන සේක්වා.

**හැම දෙනා බලයලත් මුලාදෑනීන්ට (නීතියට) යටත්වෙත්වා !**
**(රෝම 13 : 1)**
**- පහන් සිළුව -**

# උත්තරීතර යේසුස්වහන්සේ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසහාය උත්තරීතර භාවය හෙළිදරව් කෙරෙන ශුද්ධ ලියවිලි කොටසක් කොලොස්සි 1 : 13 - 18 දක්වා අපට හමුවෙයි. එම කොටසත් තවත් එවැනි දේව වචන කොටස් කියවා තේරුම් ගැනීම තුළින් යේසුස්ක්‍රිස්තුස්වහන්සේ ගේ සැබෑ අනන්‍යතාවය හඳුනා ගැනීමට අපට පුළුවන. යේසුස්වහන්සේ ආගම් කතෘ වරයෙකු හෝ ප්‍රතිහාර්ය සිදුකල ශුද්ධ ගුරුවරයෙකු හැටියට ලෝකයා විසින් උන්වහන්සේව හඳුන්වා දෙන නමුදු උන්වහන්සේගේ සැබෑ අනන්‍යතාවය එය නොවන බව එවැනි දේව වචන අධ්‍යයනයකින් අපට පසක් වනු ඇත. ශුද්ධ බයිබලය පරිහරණය කරන ඇදහිලිවතුන් හැටියට යේසුස් වහන්සේ අපගේ ගැළවුම්කරුවාණන් පමණක් නොව සියල්ලට ප්‍රධානව සිටින උත්තරීතර තැනැත්වහන්සේ බව දැනගත යුතු වේ.

**"උන්වහන්සේ (යේසුස්වහන්සේ) අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ ස්වරූපය, මුළු මැවිල්ලේ කුළුඳුලා ණෝය. මක්නිසාද සිංහාසන වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නා වූ දේවල්ද නොපෙනෙන්නාවූ දේවල් ද යන සියල්ල උන්වහන්සේ තුළ මවන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරණකොටගෙනද උනවහන්සේ උදෙසාද මවා තිබේ. උන්වහන්සේ සියල්ලට පළමුවෙන් සිටින සේක. සියල්ලද උන්වහන්සේ තුළ පවතින්නේ ය. උන්වහන්සේ සභාව නමැති ශරීරයට හිසව සිටින සේක. උන්වහන්සේ පටන්ගැන්මව මළවුන් ගෙන් කුළුඳුලාව සිටින සේක. එසේව සිටින්නේ උන්වහන්සේම සියල්ලට ප්‍රධානව සිටින පිණිසය."** (කොලොස්සි 1 :15 - 18)

ප්‍රේරිතවූ පාවුල් තුමා කොලොස්සියට ගිය බවක් හෝ එහි සභාවක් ස්ථාපිත කළ බවට සඳහනක් නැත. කොලොස්සි 2 :1 ට අනුව ඔහු මෙම ලිපිය යොමු කරන ඇදහිලි වතුන් පාවුල් සියැසින් දැක නැත. කොලොස්සි 1:7 හි සඳහන් පරිදි කොලොස්සියේ ශුභාරංචිය දේශනා කළ පුද්ගලයා වන්නට ඇත්තේ එපප්‍රස්ය. එවිට එම ස්ථානයෙහි කිතුණු ඇදහිලිවන්ත සභාවක් ගොඩ නැගෙන්නට ඇත. එහෙත් කොලොස්සි පොත කියැවූ විට අපට පෙනී යන්නේ කාලයාගේ ඇවෑමෙන් සිදුවී තිබුණු නරක තත්වයක් පිළිබඳවයි. **"ක්‍රිස්තුස්වහන්සේට එකඟ නැත්තාවූ, මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝග වලත් ලෝකයේ ගුරුකම්වලටත් ප්‍රකාරයට තිබෙන පණ්ඩිතකමද හිස්වූ රැවටිලිකාර කමද, කරණ කොට ගෙන නුඹලා කොල්ලයක් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලා ගනිල්ලා** (කොලොස්සි 2 : 8).

**"පහත් වීමටද, දේව දූතයන්ට නමස්කාර කිරීමටද කැමති වීමෙන් දිනුම නුඹලාගෙන් පහකරන්ට කිසිවකුට ඉඩනාරිල්ලා"** (කොලොස්සි 2 : 18).

ඉහත අවවාද වචනවලින් පැහැදිලි වන්නේ කොලොස්සියේ ඇදහිලිවන්ත සභාව මතට පැමිණ තිබුණ අනතුරුදායක තත්වය පිළිබඳවයි. දේව වචනය වෙනුවට "මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝග" සහ "ලෝකයේ ගුරුකම්" උගන්වන ගුරුවරු ඔවුන් අතරට පැමිණ සිටියහ. තවද යේසුස්වහන්සේට නමස්කාර කරනවා වෙනුවට දේව දූතයන්ට නමස්කාර කිරීමට උසි ගැන්වීමකුත් ඒ වන විට ඔවුන් අතරේ තිබුණි. මෙවන් සාවද්‍ය ඉගැන්වීම් ක්‍රම වර්ථමාන කාලය දක්වාම පැමිණ තිබෙන බව අප දනිමුව. පාවුල් තුමා කොලොස්සි ලිපිය ලියමින් උත්සාහ කරනුයේ ඉහත කී නිෂ්ඵල ඉැගැන්වීම් පෙන්වා දෙමින් උත්තරීතර යේසුස් වහන්සේ වෙතට ඇදහිලි වන්තයාව යොමු කිරීමයි.



අප අලුත් ඉපදීම ලැබුවායින් පසුව දේව වචනය කියවීමත්, අධ්‍යයනය කිරීමත්, පළාත් සභාවක් සමඟ සහභාගි කම් පැවැත්වීමත් අපි අනිවාර්යයෙන් නොකඩවා කළ යුතු වෙමු. විවිධ ගුරුවරුන් දේශකවරුන් පසුපස යෑමෙන් අසත්‍යය ධර්මයන් වලට අපව නිරාවරණය කර නොගත යුතු වෙමු. වඩා හොඳ දේශනා ඇසීමට සහ වඩා මිහිරි ගීතිකා රස විඳීමට ආශා කිරීමෙන් ඇතැම් විට අප මුළා විය හැකිය. ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව සත්‍ය වූ හෙළිදරව් කිරීම ඇත්තේ ශුද්ධ බයිබලයේ පමණි. කොලොස්සියේ සභාවට පැමිණි ඇතැම් දේශනා කරුවන් ස්වාමීවූ යේසුස්වහන්සේ පිළිබඳව සාවද්‍ය ඉගැන්වීම් ඇදහිලි වන්තයන්ට පවසා ඔවුන් මුලා කර තිබුණි. යේසුස්වහන්සේ දෙවියන් වහන්සේ නොවේ යැයි ද යේසුස් වහන්සේ යනු මවනු ලැබූ කෙනෙකු යැයිද පවසමින් අදහිලි වන්තයන් මුළා කිරීමට ප්‍රයත්න දරන බොරු ගුරුවරුන් අදත් බහුලය. ලෝකප්‍රකට ආගම් ධර්ම තුළින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන සාවද්‍ය ඉගැන්වීම් ප්‍රකාශ වේ. යේසුස්වහන්සේ අනාගත වක්තෘවරයෙක් යැයි ඉස්ලාම් ඇදහිල්ලේ පැවසේ. යේසුස්වහන්සේ දෙවියන්ගේ අවතාරයක් යැයි හින්දු ධර්මයේ පැවසේ. යේසුස්වහන්සේ දේව දූතයෙකු යැයි යොහෝවාගේ සාක්ෂිකරුවන් පවසන අතර උන්වහන්සේ යහපත් ගුරුවරයෙකු ලෙස පාරම්පරික කිතුණු සභාව විසින් හඳුන්වන්නට පටන් ගෙන තිබේ.

එහෙත් සත්‍ය කුමක් ද? එය කලින් කලට වෙනස් විය නොහැකිය. මේ ගැන පාවුල් තුමාගේ පිළිතුර මෙසේයි. "යේසුස්වහන්සේ තුළ මුළු පූර්ණ කම පවතියි" (කොලොස්සි 1:19) "මක්නිසාද උන්වහන්සේ (යේසුස් වහන්සේ) තුළ දේවත්වයේ සියලු පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය." (කොලොස්සි 2 : 9) සැබවින්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දේවත්වයේ පූර්ණකම ශරීරාකාර යෙන් වාසය කරන සේක. මේ නිසා උන්වහන්සේ අසහාය උත්තරීතර තැනැත්වහන්සේ ය. ලෝකයාගේ ඇස් මේ සත්‍යතාවයට අන්ධව ඇත. කොලොස්සි 1 : 15 - 18 දක්වා කියැවී මෙන් යේසුස්වහන්සේගේ සැබෑ අනන්‍යතාවය අපට හඳුනාගත හැකිය.

යේසුස්වහන්සේගේ සැබෑ අනන්‍යතාවය පැහැදිලි වන පරිදි යේසුස්වහන්සේ පිළිබඳව විස්තර කිහිපයක් සලකා බලන්නට මම ඔබට ඇරයුම් කරමි. ඒ අලුත් ගිවිසුමේ විවිධ තැන්වලින් උපුටා ගත් යේසුස් වහන්සේ පිළිබඳ ප්‍රකාශන කිහිපයකි. ඒවා මෙනෙහි කල විට උන්වහන්සේ කොපමණ ශ්‍රේෂ්ඨදැයි අපගේ සිත්වලට හැඟීයනු ඇත.

1. පළමුවෙනියා සහ අන්තිමයා
   එළිදරව් 2 : 8
2. මුළු මැවිල්ලේ කුළුඳුලානන්
   කොලොස්සි 1 : 15
3. අපගේ ඇදහිල්ලේ කතෘතුමා සහ සම්පූර්ණ කරන්නා
   හෙබ්‍රෙව් 12: 1
4. මලවුන්ගෙන් නැගිටි කුළුඳුලා
   කොලොස්සි 1 : 18
5. සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා
   එපීස 1 : 22
6. රජවරුන්ගේ රජ - එළිදරව් 19:16
7. සදාකාලික රජ - 1 තිමෝති 1 : 17

**මතු සම්බන්ධයි**

**-නෙවිල් ජයසුන්දර-**

**පාපයෙන් ගැළවීම ලැබීම උසස්ම නිදහසයි.**

# හොඳම හොඳම දේ

**ප්‍රේමය පව් රාශියක් වසන බැවින්...**
**(1 පේතෘස් 4:8)**

පළවන පේත්‍රුස් පොතේ සඳහන් වන ඉහත වචන තමන්ගේම අත්දැකීම් අලලා ලියනු ලැබුවේ පේත්‍රුස් විසින්මය. ඔහු යේසුස් වහන්සේගේ ගෝලයන් අතරින් උන්වහන්සේ ළඟින්ම සිටි කෙනෙකි. අවුරුදු 3 1/2 ක් යේසුස්වහන්සේ සමඟ ඊශ්‍රායෙල් ගම් නියම් ගම් හා ඇවිද විවිධ ආකාරයේ සේවයේ අත්දැකීම් බහුලව සිටි ඔහු තම පුද්ගලික ජීවිතයේ දී යේසුස්වහන්සේ සමඟ පුද්ගලික සම්බන්ධතාවයක් පැවතිණ.

එක් අවස්ථාවකදී යේසුස් වහන්සේ හඳුනන්නේ නෑ කියා තුන් වතාවක් පේතෘස් කීවේ ය. එය යුදස් ගේ පාවාදීමට නොදෙවෙනිය. තවත් අවස්ථාවක දී මල්කස් නමැති සොල්දාදු වෙකුට කඩුවෙන් ගසා කන කපා දැමීය. ඒ හැම අවස්ථාවක දී ම යේසුස් වහන්සේ ඔහුට, සමාව දීම හා ඔහු නැවත පිළිගැනීම සිදුවිය. පේතෘස්ගේ අවිස්වාසවන්ත කමදී හා දුර්වලකමේ දී යේසුස් වහන්සේගේ ප්‍රේමය ඊට ඉහළින් ක්‍රියා කළේය. ඔහුගේ සියලු වැරදි යේසුස්වහන්සේ ගේ නොවෙනස් වන ප්‍රේමයෙන් වසනු ලැබීය. අවසානයේ ඔහු බලවත් දේව දාසයෙකු බවට පත් විය. පසු කාලීනව පේත්‍රුස් තම ජීවිතය දෙස හැරී බලන විට ඔහුට තේරුම් ගියේ එකම දෙයයි. එනම් තමාට මෙතෙක් දුරගමන් කිරීමට හැකි වූයේ යේසුස්වහන්සේ කොන්දේසි විරහිතව තමාට ප්‍රේම කළ නිසා තමාගේ සියලු වැරදි එම ප්‍රේම යෙන් වැසී ගිය බවය. එනම් මේ සියලු පාප වලට යේසුස්වහන්සේ සමාව දී ඇති බවයි. එය අගාපේ ප්‍රේමය ලෙස හැඳින්වේ.

ඔබට ඔබගේ සියලු පාප, වැරදි, දුර්වලතාවයන් හා වැටීම් වලට එකම පිළිසරණ යේසුස්වහන්සේ ගේ ප්‍රේමයයි. ඔබගේ ආගම ඔබ නීතිරීති වලට යටත් කරන අතර යේසුස්වහන්සේ ඔබව නීතිරීති වලින් නිදහස් කරයි. සියලු පාපවලට සමාව දී ඒ වෙනුවට නව ජීවනයක් හා බලාපොරොත්තුවක් දීමට හැකි එකම බලවේගය වන්නේ ක්‍රිස්තු ප්‍රේමයයි.

**දෙවියන්වහන්සේ ඉදිරියේ, සැබෑ ශ්‍රේෂ්ඨත්වය යනු අන් අයට ප්‍රේමය කිරීමයි.**

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයේ ගුණාංග

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය.
2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය ගුණවන්තය.
3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය ඊර්ෂ්‍යාවන්නේ නැත.
4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය පාරට්ටු කරන්නේ නැත.
5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය උඩඟු වන්නේ නැත.
6. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අශෝභන ලෙස හැසිරෙන්නේ නැත.
7. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය තමාගේ කාරණාව සොයන්නේ නැත.
8. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය කෝප වන්නේ නැත.
9. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය නපුර ගනන් ගන්නේ නැත.
10. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අධර්මිෂ්ඨ කමට ප්‍රීති වන්නේ නැත.
11. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය සැබෑව සමඟ ප්‍රීතිවන්නේ ය.
12. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය සියල්ල දරාගන්නේ ය.
13. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය සියල්ල විශ්වාස කරන්නේ ය.
14. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය සියල්ල බලාපොරොත්තු වන්නේ ය.
15. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය සියල්ල ඉවසන්නේ ය.
16. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය කිසිකලක පහවන්නේ නැත.

## මනුෂ්‍යයා තුළ පවතින පාපයේ ප්‍රතිඵල

- නොඉවසිලිවන්තකම
- ඊෂ්‍යයාව
- අශෝභනකම
- කෝපය
- කලකිරීම හෝ වැටුනු ස්වභාවය
- වංචාකාරකම/ බොරුකොරකම/ කපටිකම
- කිපෙනසුළුභාවය
- අවිශ්වාසවන්තකම
- පව්කිරීමට කැමති භාවය
- තමාටම ප්‍රේම කරන අයට පමණක් ප්‍රේම කරන ස්වභාවය
- නපුරුකම
- උඩගුකම
- ආත්මාර්ථකාමීත්වය.
- අධර්මිෂ්ඨකම
- ලාමකභාවය
- බලාපොරොත්තු කඩවීම

පාපයේ ප්‍රතිඵල සියල්ලටම විසඳුම කොන්දේසි විරහිත යේසුස් වහන්සේගේ ප්‍රේමයයි. යමෙක් උන්වහන්සේගේ ප්‍රේමය විශ්වාස කරන විට ඔහුගේ හෝ ඇයගේ ජීවිතය පරිපූර්ණ ලෙස වෙනසකට භාජනය වෙයි.

**- මිකායෙල් -**

# නිවැරදි තේරීම

**"සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්නත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත් ය"** යොහන් 10:10

ඔබගේ ආත්මයේ සදාකාලික ඉරණම විසඳීමට සමත් දෙදෙනෙකු ගේ පැමිණීම පිළිබඳව ඉහත බයිබල් පදයෙහි යේසුස්වහන්සේ විග්‍රහ කරන සේක. ඔබගේ ආත්මය මුළු ලොවට වඩා වටිනා වස්තුවක් බව ශුද්ධ බයිබල යෙහි පවසන අතර එම ආත්මයට අයිතිවාසිකම් කීමට දෙදෙනෙකු පැමිණේ. මේ දෙදෙනා ගැන මදකට කල්පනා කර බලන්න.

## සොරාගේ පැමිණීම

"සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්ටත් ය." මෙහි සඳහන් සොරා අනිකෙකු නොව සාතන්වන යක්ෂයා ය. ඔහු ඔබ වෙතට එන්නේ කුමන අරමුණෙන් දැයි ඉහත පදයෙහි යේසුස්වහන්සේ ප්‍රකාශ කලසේක. පළමුවෙන් ඔහු පැමිණෙන්නේ "සොරකම් කරන්ටය." යක්ෂයා ආරම්භයේ සිටම සොරෙකි. මිනීමරුවෙකි. දෙවියන්වහන්සේ මිනිසාට දී තිබූ උන්වහන්සේගේ මහිමය ඔහු මුලින්ම ආදම් සහ ඒව වෙතින් සොරකම් කලේය. එදා මෙදා තුර ඔහු මෙම සොරකමෙහි යෙදී සිටියි. දෙවියන්වහන්සේ වෙතින් මිනිසාට ලබා දෙන ආශිර්වාද සොරා ගැනීමටත්, මනුෂ්‍යයා විසින් දෙවියන් වහන්සේට ලැබිය යුතු නමස්කාරය සොරා ගැනීමටත් යක්ෂයා සමත්ය. මේ නිසාම සංහතිය දෙවියන්වහන්සේ ගෙන් වෙන් වී පාප අන්ධකාරයෙහි අතරමං වී ජීවත් වෙයි.

දෙවනුව යක්ෂයා එන්නේ "මරන්ටත්ය". යක්ෂයා අපට කරන අවැඩනම් අප ආත්මික ලෙස මරා දැමීමයි. පාපය කරණකොට ගෙන ඔබගේ ආත්මය මරණයට පත්ව තිබේ. එවිට දෙවියන්වහන්සේ සමඟ ජීවමාන සම්බන්ධතාවයක් පවත්වා ගෙන යා නොහැක. අවසානයේ දී සදාකාලික මරණය අත්වීමත් මින් අදහස් කෙරේ. අපගේ පාප සහ වරද කරණකොටගෙන අපගේ ජීව අත්මය මැරී තිබුණු බව එපීස 2:1 හි සඳහන් වේ. දෙවියන්වහන්සේ අදහා ගැනීමකින් තොරව ඔබ යක්ෂයා යටතෙහි ජීවත් වන්නෙහි නම් ඔබගේ කණගාටුදායක තත්වය මෙසේය.

තුන්වෙනුව යක්ෂයා පැමිණෙන්නේ "විනාශකරන්ට" බව යේසුස්වහන්සේ පැවසූ සේක. මෙය ඔබ මුහුණ දිය හැකි අති භයානකම තත්වයයි. මෙහි විනාශ කිරීම යනුවෙන් අදහස් වනු ඇත්තේ අපාගතවී සිදුවන මහා විනාශයයි.

යක්ෂයාගේ අවසාන කුරුමානම එයයි. පළමුව දෙවියන්වහන්සේගේ මහිමය ඔබෙන් සොරා ගෙන දෙවනුව ඔබව ආත්මික ලෙස මරා දමා, තෙවනුව සදාකාලික නිරයෙහි හෙළා විනාශ කිරීමට යක්ෂයා කුරුමානම් අල්ලයි. මේ තමයි යක්ෂයාගේ පැමිණීමේ තුන්ප්‍රකාර අරමුණ.

## යේසුස්වහන්සේගේ පැමිණීම

යොහන් 10:10 හි සඳහන් දෙවැනි පුද්ගලයා යේසුස්ක්‍රිස්තුස් වහන්සේ ය. උන්වහන්සේගේ පැමිණී මේ අරමුණ මෙසේයි. "මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය." යේසුස්වහන්සේ ඔබට ප්‍රධාන කරන්නේ ජීවනයයි. එනම් දෙවියන් වහන්සේ සමඟ ජීවමාන සම්බන්ධ තාවයයි. මැරී තිබෙන ඔබගේ ආත්මය යළි ප්‍රාණවත් කර දෙවියන්වහන්සේ සමඟ සැබෑ සම්බන්ධ තාවයකට ඔබ ඇතුළත් කළ හැක්කේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේටම ය. එපමණක් නොව ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඇදහිල්ල, නිදහස සහ බලාපොරොත්තුව වැනි උතුම් දේ ඔබට දෙමින් අධික ජීවනයක් ඇතුළුව ජීවත් වීමට යේසුස්වහන්සේ ඔබට හැකියාව දෙන සේක. උන්වහන්සේට පමණක් එය කළ හැකි වේ. ඔබගේ පාපය උදෙසා කුරුසියක් මත දිවි පිදූ යේසුස්වහන්සේ මළවුන් ගෙන් නැවත නැගිට ජීවමානව සිටින හෙයින් පොරොන්දු වූ මේ දේ ඉටු කරන්නට උන්වහන්සේට හැකියාව තිබේ. තවත් පාප අන්ධකාර යෙහි කල්ගත නොකොට මුළු හදවතින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විශ්වාස කරන්නට අපි ඔබට ආරාධනා කරන්නෙමු. සදාකාලික නිරය වෙනුවට සදාකාලික ස්වර්ගය ඔබට දෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ය. මේ දැන් උන්වහන්සේට යාච්ඤා කරමින් ඔබගේ පව් කියා දී සමාව ඉල්ලා උන්වහන්සේව ඔබගේ හදවතට ආරාධනා කර පිළිගන්න.

ඔබගේ ආත්මය පිළිගැනීමට දෙදෙනෙකු ඉදිරිපත් වී සිටිති. තීරණය ඇත්තේ ඔබගේ අතේය. එම තීරණය ඔබගේ සදාකාලික අනාගත ඉරණම තීරණය කරනු ඇත. නිවැරදි තෝරා ගැනීමකින් ඔබට සදාකාලික සුගතිය ලඟා කරගත හැක. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ ඔබට ජීවනය අධික ලෙස ලැබෙන පිණිසය.

**- ජීවන හඬ -**

*දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහන්නාවූ නුඹලාට මේ දේ ලියා එවුවේ නුඹලාට සදාකාල ජීවනය ඇති බව දැනගන්නා පිණිසය*
*(1 යොහන් 5 : 13).*

# වලං කඩේ මහා කලබලයක්



දිනක් හන්දියේ පිහිටි වලං කඩේ මහා කලබලයක්. එහි විකිණීමට තිබූ මැටි භාණ්ඩ අතර වැදගත්ම කෙනා කවුද කියා මහා වාදයක් හට ගෙන ඇත. ලස්සන මල් පෝච්චියක් තම ආඩම්බර කම පෙන්වමින් මෙසේ කියයි. "මම තමයි මිනිසුන්ගේ වැඩි අවධානයට ලක් වෙන්නේ, සාලයේ මැද ඉන්නෙත්. මිනිසුන්ගේ ගෙවල් ලස්සන කරන්නෙත් මමයි. මම තමයි මිනිසුන් වැඩියෙන් ඉල්ලන්නෙත්." ඒ නිසා මම තමයි මෙතැන තියෙන වැදගත්ම භාජනය. මේක අහගෙන හිටපු ලොකු ජෝගුවක් ටිකක් කේන්තියෙන් හා උජාරුවෙන් කතා කරයි. මම තමයි මිනිසුන්ට අත්‍යවශ්‍ය පුද්ගලයා. පිපාසය නිවන්නේ මම, වැඩියෙන්ම මිනිසුන් සොයන්නේ මාවයි. දිනකට කී වතාවක් මිනිස්සු මගේ ලඟට එනවද? මාව පාවිච්චි කරනවා ද? ඒ නිසා මම තමයි වැදගත්ම තැනැත්තා." මේක අහගෙන හිටපු හැලියට කේන්ති ගියා. "ඔයාලා මොනවද මේ කියන්නේ. මම නැත්නම් මිනිසුන් බඩගින්නේ. හාල් තමයි කන්න වෙන්නේ. මම තමයි බත් උයන්නේ. වතුර උණු කරන්නේ. මම නැත්නම් මිනිස්සු මැරිලා යයි. ඒ නිසා මම තමයි වැදගත්ම පුද්ගලයා. මමයි ප්‍රධානියා වෙන්න ඕනෑ." ටික වේලාවක නිහඬතාවයක් පැවතිණි. හදිස්සියේ ම කැටය පෙරළි පෙරළී මැදට පැන්නේ ය. "මම තමයි මිනිසුන්ගේ අනාගතය හදන්නේ. සල්ලි ඉතුරු කරලා දෙන්නේ. ඉතුරු කරන්න පුරුදු කරන්නේ. අඩුවෙන්ම වියදම් කරන්නේ. මම නිසයි. මම තමයි වැදගත්ම සේවය කරන්නේ. ඒ නිසා මම තමයි වැදගත්ම. මමයි ප්‍රධානියා වෙන්න සුදුස්සා." කළයද වාදයට එළඹී මෙසේ කේන්තියෙන් පැවසීය. "මගේ අගේ දන්නේ නැතිවයි ඔහෙලා කෑමොර දෙන්නේ. මමයි ගෙදර අවශ්‍යය වතුර ටික සපයන්නේ. ගබඩා කර තබන්නේ. මම නිතරම කාන්තාවන් සමඟ ගැවසෙන්නේ. සුන්දර කාන්තාවන්ගේ උකුලෙමයි මම ගමන් යන්නේ. ඔවුන් මට හරි ආදරෙයි. මම නැත්නම් ගෙදර වතුරත් නෑ. ඒ නිසා මමයි වැදගත්. මමයි ප්‍රධානියා." මෙසේ වාදය සැරටම හැමදාම කරගෙන ගියා. දිනත් එම පළාතට මහා කුණාටු සහිත වර්ෂාවක් පැමිණියා. හන්දියේ වලං කඩේ හදලා තිබුණේ පොල් අතු වලින් හා කටු මැටි

වලින්ය. සුළඟ වැඩිවෙත්ම කඩයද සෙලවීමට පටන් ගත්තා. මැටි භාණ්ඩ එක එක රාක්ක වලින් බිමට වැටී සුනු විසුනු විය. කුණාටුව දරුණු විය. රාක්ක බිත්තියෙන් ගැලවී බිමට වැටිණි. එහි තිබූ සියළුම මල් පෝච්චි කැට, වලං, හට්ටි මුට්ටි සියල්ල කෑලි කෑලි වලට බිඳී ගොස් ඇත. දැන් සියල්ල වලං කටු ගොඩක් පමණයි.

මේ අතර මුල්ලක තිබූ මැටි ගුලියක් මෙසේ පැවසීය. "හොඳ වැඩේ. ප්‍රධානියා වෙන්න හැදුවට, හොඳම පාඩමක් ඉගෙන ගත්තා. ඔය ගොල්ලොත් ඉස්සර මැටි ගුලියක් පමණයි. කුඹල් මාමා තමයි ඔය අය හැදුවේ. ඒ නිසා මෙම වලං කඩේ ප්‍රධානියා කුඹල් මාමා විතරයි.

ප්‍රිය මිතුර මිතුරිය, මෙහි ඇදහිලිවන්තයන් වන අපට හොඳ පාඩමක් හා සිතට ගත යුතු කාරණා බොහොමයක් තිබේ. අපි සියල්ලෝම දෙවියන් වහන්සේ අතේ මැටි ගුලියක් වාගේ යයි ශුද්ධ බයිබලය පවසයි. (යෙරමියා 18 : 6). එක එක භාජනය ඒ හැඩයට නිර්මාණය කරන්නේ කුඹල්කරු වූ දෙවියන්වහන්සේමය. ඒ ඒ භාජනයට වෙන් වූ එක එක සේවයක් තිබෙන අතර එය බෙදා දෙන්නේ ද දෙවියන්වහන්සේමය. අපට සුදුසු සේවයට අප පත් කරන්නේ ද දෙවියන්වහන්සේමය. නමුත් ඒ හැම සේවයක් ම යේසුස්වහන්සේ තුළ එක සමානය. තරාතිරම් බැලීමක් නැත. සභාවේ ප්‍රධානියොත් ආහාර පිසින අයත් යේසුස්වහන්සේ තුළ එක සමානයි. මෙම දිව්‍ය ප්‍රතිපත්තියට ගරු කිරීමටත් එය පිළිගැනීමට පුරුදු පුහුණු වන්න. අප මනින්නනේ ප්‍රේමය නමැති මිම්මෙන් මිස සේවයේ තරාතිරමෙන් නොවේය. තව කෙනෙකු පහත් කර කතා කිරීමටත්, තමාම උසස් කර නොගැනීමටත් අධිෂ්ඨාන කර ගන්න. මුළු ගෞරවය දෙවියන් වහන්සේටත් යේසුස්වහන්සේටත් දීම අපගේ වගකීමයි.

**- ගුරුහරු -**



**අපි සියල්ලෝම දෙවියන්වහන්සේ අතේ මැටි ගුලියක් වාගේ යයි ශුද්ධ බයිබලය පවසයි.**

# සැබෑ කිතුණු සභාවක ගුණාංග

- එය ආගමක් නොවේ. සංවිධානයක් හෝ සමිතියක් නොවේ. නිකායක් නොවේ. එකම ශරීරයකි. (1 කොරින්ති 12 : 13)
- මෙම ශරීරයේ එකිනෙක අවයවයන් දේවදරුවන් ය.
- සභාව නමැති ශරීරයේ හිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ය. යම්සේ ශරීරය හිස යටතේ පාලනය වේද, සභාවේ පාලනය ද එතුමන් අතේ ය. (එපීස 1 : 21)
- සියලු දෙනාම එක්නෙකෙනකු මෙන් ය. පක්ෂග්‍රාහී කිසිවක් නැත. (ගලාති 3 : 28)
- නියම කිතු සභාවේ තරාතිරම්, කුලය, ජාතිය, සමාජ තත්වය, ධනවත්, දුගී, උගත් නූගත්, ආදී කිසි බේදයක් නැත. (ගලාති 3 : 26 - 28)
- සභාවේ උරුමය සගලොවය. ( 1 පේත්‍රුස් 1 : 4)
- සභාවට ඇතුළත් වන්නේ ආත්මික නව උපතකින් ය. බව්තීස්මයෙන් හෝ නම් ලියා ගැනීමෙන් නොවේය. (යොහන් 3 : 3)
- ඔබට තනිව එම සභාවේ සිටිය නොහැක. එකිනෙකාගේ සහයෝගය හා අන්‍යෝන්‍ය උපකාරය අවශ්‍ය වේ. (ක්‍රියා 13 : 1 - 3)
- නියම කිතු සභාව දෙවියන්වහන්සේගේ වාසස්ථානයයි. (1 කොරින්ති 3 : 18)
- එය දෙවියන්වහන්සේගේ ගෘහයයි. (එපීස 2 : 20 - 23)
- නිරාදොරටුව ඊට විරුද්ධය ජයගන්නේ නැත. (මතෙව් 16 : 18)
- දේව දරුවන්නේ නාමයන් ස්වර්ගයෙහි බැටළු පැටවාණන්ගේ පොතෙහි ලියැවේ. භූමික පොතක නොලියවේ. (එළිදරව් 21 : 27)
- යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමේ දී සැබෑ කිතු සභාව ස්වර්ගාරෝහණය වේ. (1 තෙසලෝනික 4 : 13 - 18)
- එහි ගිහි පැවිදි බෙදීමක් නොමැත. (1 පේත්‍රුස් 2 : 5)
- පැවිදි නොවන, නායකයන් හෝ පාලකයන් එහි සිටියි. (එපීස 4 : 11)
- නියම කිතු සභාවෙ නිකායයන්ගේ එක්සත් කිරීමට ප්‍රයත්න නොදරති. එක ශරීරයක් නම් එවැනි එක්සත් කිරීම් නුවමනාය. (1 කොරින්ති 12 : 14)
- නියම කිතු සභාවේ අවයවයෝ එකිනෙක විනිශ්චය කර නොගනිති. එකිනෙකාව පහත් කර නොගනිති. (1 කොරින්ති 12 : 15 - 23)
- එය දේව වචනයේ ප්‍රතිපත්ති මිස මිනිස් මත පිළිගන්නේ නැත.
- නියම කිතු සභාවේ මිනිස් පාලනයක් නොමැත. (එපීස 1:22)
- එය යේසුස් වහන්සේගේ දෙවන ඊම උනන්දුවෙන් බලාසිටිමින් ආත්ම දිනාගැනීමේ සේවයේ වඩ වඩා නිරතවේ.

ඉහත දැක්වූ කරුණු නියම, සත්‍යවූ ඇදහිලිවන්ත සභාවේ ගුණාංග දක්වයි. මෙහි වගකීම අප එකිනෙකා සතුයි.